# ජූලියන් හිල් ශ්‍රී ලාංකික ප්‍රජාව සමග



2016 ක් වූ අප්‍රියෙල් මස 10 වෙන ඉරුදින ශ්‍රී ලංකා ජර්මානු කාර්මික අභ්‍යාස ආයතනයේ ආදි ශිෂ්‍යයන් විසින් 22 වරටත් මෙල්බන් බක් මහ උළෙල පවත්වන ලදී. මෙහිදී දැනට විපක්ෂ නායකයා වන බිල් ෂෝටන් සහ කම්කරු පක්ෂ අපෙක්ෂක ජූලියන් හිල් ද සහභාගි වූහ. මොවුන් දෙදෙනාම ඉතාම හොඳ මිතුරන් වන අතර මෙම බක්මහ උළෙලට සහභාගී වී වචන ස්වල්පයක් කතා කිරීමේ භාග්‍ය ලැබීම ගැන ඔවුහු ඉතාමත් සතුටට පත් වූහ.

ජූලියන් ඔහුගේ කතාවේ නූතන ඕස්ට්‍රේලියාවේ පවතින සංස්කෘතීන් කිහිපයකට අයත් ජනයාගේ සහජීවනය මෙම උත්සවයෙන් ඉතාමත් හොඳින් පැහැදිලි වන බව විදහා දැක්වූ අතර තවද ඔහු තමන්ගේ ශ්‍රී ලංකාව සග පැවති ඉතාමත් සමීප පුද්ගලික සම්බන්ධකම් ගැන පවසා සිටියේය. ඔහුගේ පාසල් සමයේදී ශ්‍රී ලංකාවේ සිසුවෙක් ඕස්ට්‍රේලියාවට පැමිණ ඉගෙනීම් කටයුතු වලට යෙදීමට ඔහුගේ පවුලේ අය සමග නතර වී සිටි බවද සඳහන් කලේය. ඔහුගේ මව ශ්‍රී ලංකාවට බොහෝ වතාවක් සංචාරය සඳහා ගොස් ඇති අතර ඇයගේ ශ්‍රී ලාංකික හිතවතුන් ඇයව තම පවුලේ සාමාජිකයෙක් ලෙස පිලිගෙන ආගන්තුක සත්කාරයෙන් පිදුම් දක්වා ඇත.

ඔහු මහජන ඡන්දයෙන් මෙවර තෝරා පත්වන්නේනම් ඔහුට සිංහල ජනයා සමග පවත්වාගෙන එන මෙම මිත්‍රත්වය තව දුරටත් වැඩි දියුණු කර ගැනීමේ අවස්ථාව ලැබෙන බව ඔහු පවසා සිටියේය.

## ජූලියන් හිල්

ජූලියන් හිල් ඉතාමත් දක්ෂ, දේශපාලන පලපුරුද්දක් ඇති සිංහල ජනයා වෙනුවෙන් ඕස්ට්‍රේලියානු පාර්ලිමේන්තුව තුල විශාල සේවයක් ඉටු කල හැකි පුද්ගලයෙකි. ජූලියන් හැදී වැඩී ඇත්තේ දකුණු නැගෙනහිර මෙල්බන් ප්‍රදේශයේය. ඔහු උපත ලබා ඇත්තේ බර්වුඩ් ප්‍රදේශයේ වන අතර අධ්‍යාපනය ලබා ඇත්තේ ග්ලේන් වැවිලි පාසලේය. ඔහු මොනෑෂ් විශ්ව විද්‍යාලයේ උසස් අධ්‍යාපනය හදාරා විද්‍යාව සහ නීතිය පිළිබඳව උපාධි ලබාගෙන ඇත.

ඔහු තනි දෙමව්පියෙක් වශයෙන් බොහෝ කාලයක් ගත කළ අතර ඔහුගේ එකම දියණිය දැනට විශ්ව විද්‍යාල අධ්‍යාපනය හදා රයි. ඔහු ඕස්ට්‍රේලියානු කම්කරු පක්ෂයේ අවුරුදු විස්සකට වැඩි සාමාජිකයෙකි. ඔහු තම ජීවිතයේ වැඩි කොටසක් කැපකර ඇත්තේ දේශපාලන දියුණුව ප්‍රජාසත්කාරය සහ රාජ්‍ය ප්‍රතිපත්ති වැඩි දියුණුව උදෙසා වන අතර ඇලින් ග්‍රිෆන් නැමති අමාත්‍යවරයා යටතේ බෘස් නමැති ප්‍රදේශයේ වසර පමහක් සේවය කර ඇත. ඇලන් ග්‍රිෆන් දැනට ඔස්ට්‍රේලියානු පාර්ලිමේන්තුවේ ෆෙඩරල් ආණ්ඩු ක්‍රමයේ සාමාජිකයෙකි. ජූලියන් හට දක්ෂතාවයෙන් පිරිපුන් නිකිලිටි දේශපාලන ඉතිහාසයක් ඇත. ඔහු බොහෝ ඉහල තනතුරු දරා ඇති අතර එම තනතුරු නම් ආර්ථික සංවර්ධනයේ අධ්‍යක්ෂක තනතුරු, සේවා නියුක්ති කටයුතු සඳහා ප්‍රජා හා පළාත් සංවර්ධන කටයුතු එමෙන්ම නාගරික සැළසුම් සහ ප්‍රවාහන කටයුතු, ව්‍යාපාර කටයුතු, පලාත් පාලනය සම්බන්ධව ඕස්ට්‍රේලියාවේ ආදිවාසි අදාල ප්‍රශ්න සම්බන්ධව සංක්‍රමණතා කටයුතු, වෙළඳ හා ජාත්‍යාන්තර කටයුතු වේ.

දැනට මොහු වික්ටෝරියා ප්‍රාන්තයේ රාජ්‍ය පරිපාලන කටයුතු සම්බන්ධ සංවිධානයේ සාමාජිකයෙකු වශයෙන් ක්‍රියා කරයි.

සැකසුම,
ජානකී රාජගුරු







